# සංඝරත්නයට කරන උක් පූජාවේ විපාකය
# දෙව් මිනිස් සැප කෙළවර
# අමා මහ නිවනට ම හේතු වූ වගයි

## අධිමුත්ත ස්ථවිරාවදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 156 - 157)

අත්ථදස්සී බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පාන ලද කාලයේ එක් පුද්ගලයෙක් උතුම් වූ ගුණ ඇති සංඝරත්නය වෙනුවෙන් මඩුවක් සාදා එහි දී උක් පූජා කළා.

ඔහුට අත් වුනේ අදහන්නටත් බැරි විපාකයක්!

කල්ප එක්දහස් අටසියයක් ම ඉපදුණේ සුගතියේ පමණයි. කිසිවෙකුට දෙවැනි නොවන දිව්‍ය හා මිනිස් ආත්ම ලැබුවා. අවසානයේ ගෞතම බුදු රජාණන් වහන්සේගේ ශාසනයේ පැවිදි ව සසර ගමන කෙළවර කළා.